

# සිරිල් ධර්මවර්ධන

## සොඳුරු රංගධරයා සමග සැන්දෑවක්



"සරණපාල - ඡන්දෙ ඉවරවුණාම මොකද වෙන්නෙ. එතකොට ජයවේවා කියල කෑගහපු එවුන් ඕනෙත් නෑ.. මල්මාලා දාපු එවුන් ඕනෙත් නැහැ.. එතකොට බොහොම ලස්සනට ඇවිත් නීතිය අකුරටම ක්‍රියාත්මක කරයි.. මොකා රජවුණත් කෙරුවාව ඕකයි.. දේශපාලනය කියන්නෙ උසාවියෙන් දඬුවම් කරන්න බැරි කයිරාටික සූදුවක්.. අපි හැම එකාටම කොලේ කොලේ බෙදාගෙන යනවා. තුරුම්පු ටික උන් ඉතුරු කරගෙන.. අපි කතිරෙ ගැහුවත් එකයි .. උන්ට නැතත් එකයි.. "



සිරිල් ධර්මවර්ධන (සරණපාල) ගීතා කාන්ති ජයකොඩි (සුරංගි) විජුම බෝගොඩ (කළු මල්ලි) සහ නිල් අලස් (ලුවිටෝ)



නිල් අලස් (ලුවිටෝ) සිරිල් ධර්මවර්ධන (සරණපාල)

කැළණි පාලම නාට්‍ය නැරඹූ බොහෝ දෙනෙකුට මේ දෙබස් ඛාණ්ඩය ඇසුන විට මතකයට එන නමයි සරණපාල . ඒ අපූරු තරුණයාගේ භූමිකාව නිරූපනය කළ දැවැන්තයා නාට්‍යයේ චරිතයේ මෙන්ම වේදිකාවේත් අනෙකුත් සෑම තැනකදීමත් අසාධාරණය හා අයුක්තියට එරෙහිව විශාල හඬක් නගන, හිත හොඳ, කාටත් උපකාර කිරීමට සැදී පැහැදී සිටින, අපූරු චරිතාංග නලුවා වෙන කවුරුත් නොව සිරිල් ධර්මවර්ධන නම් වන දැවැන්ත කලාශිල්පියා ය.

සිරිල් ධර්මවර්ධන ගැන දන්නා බොහෝ දෙනා අතරේ ඇතමෙකු නොදන්නා කරුණුද වෙයි. එනම් ඔහුගේ දැවැන්ත වේදිකා අත්දැකීමයි. මා බාලයේ සිට ඔහු හොඳින් හඳුනන බැවින් මේ කරුණු ඔහුගේ මුවින් ලබාගැණීමට මා සමත් වූවායයි මට සිතෙයි. යමක් ඇසූ විට ඔහු එකවරම කියා සිටින්නේ "අනේ ඕව ඕනෙ නැහැ මල්ලි" යනුවෙන් ය. නමුත් මෙල්බර්න් නගරයේ වෙසෙන කලාවට හිතැති කලාවට ආදරය කරන බොහෝ දෙනා වෙනුවෙන් ඔහුගේ නාට්‍ය ජීවිතයේ අත්දැකීම් පිලිබඳව කෙටි සටහනක් සන්නස පාඨකයන් වෙනුවෙන් මෙසේ ඉදිරිපත් කරමු.

**සිරිල්**
මම මුලින්ම වේදිකාවට සම්බන්ධ වෙන්නෙ රිච්මන්ඩ් විද්‍යාලයෙන්.. එහි ඉගෙනගන්නා කාලයේ අපි කවුරුත් ආදරය කරන වීදි නාට්‍ය කලාවේ පියා ලෙසින් හඳුන්වන අපේ හිතාදර මිත්‍ර ගාමිණී හත්තෙට්ටුවේගම ඉගෙනුම ලැබවේත් අපේ පාසලේ. ඔහු පාසලේ යම් යම් නාට්‍ය ඉදිරිපත් කළා. ඒ නාට්‍ය වලට මම සම්බන්ධ වුනා.. විශ්ව විද්‍යාල ප්‍රවේශයෙන් පස්සෙ ප්‍රතිඵල එනකම් ඔහු අපේ ගුරුවරයකු බවට පත්වුණා. ඒ කාලයේ ඔහු අපේ නාට්‍ය ගුරුවරයාද වුණා. ඒ වගේම ඔහු අපේ පවුලේ මිත්‍රයෙක්ද වුණා. මගේ වේදිකා ආගමන ආරම්භවන්නේ එහෙමයි.

**ශ්‍රීනාත්**
කොහොමද ප්‍රසිද්ධ වේදිකාවට සම්ප්‍රාප්ත වෙන්නෙ?

**සිරිල්**
උපාධියෙන් පසුව මම වෙස්ලි විද්‍යාලයේ ගුරුවරයකු ලෙස වැඩ කළා. ඒ කාලේ මට හොඳ මිත්‍රයන් දෙදෙනෙක් හමුවුණා. ඔවුනුත් ගුරු මණ්ඩලයේ සාමාජිකයන්. ඒ තමයි ෆීලික්ස් ප්‍රේමවර්ධන සහ බැසිල් මිහිරිපැන්න. ඒ අතරින් ෆීලික්ස් ප්‍රේමවර්ධනයන් මාව හෙන්රි ජයසේන නමැති අපූරු නාට්‍යවේදියා ළඟට රැගෙන යනවා. හෙන්රි ජයසේන මහතා ඒ දිනවල මනරංජන වැඩවර්ජන නාට්‍යය පුහුණුවීම් කරන කාලයයි. මගේ මතකයේ හැටියට 1976.. හෙන්රි ජයසේනයන් මාව ඒ නාට්‍යයට සම්බන්ධ කරගත්තා. ඊට පස්සෙ ඔහුගේම හුණුවටය, අපට පුතේ මගක් නැතේ, මකරාක්ෂයා, සරණ සියොත් සේ පුතුනි හඹා යන, දිරිය මව සහ ඇගේ දරුවෝ යන නාට්‍ය වල රඟපෑවා.. මේ අතරේදී මට ආර් ආර් සමරකෝන් මහතා හමුවුණා. ඔහු මාව ඉඩම නාට්‍යයට තෝරාගන්නවා. අපේ ප්‍රවීණ කලාශිල්පි රවීන්ද්‍ර රන්දෙණිය සොයුරාත් රංගනයෙන් ඉඩම නාට්‍යයට සම්බන්ධ වුණා. ඉන්පස්සෙ දූවිලි වැනි නාට්‍ය වලට මම රංගනයෙන් දායක වුණා. ඒ එක්කම ධර්මසිරි බණ්ඩාරනායකගේ ඒකාඅධිපති ෆීලික්ස් ප්‍රේමවර්ධනගේ ඈස් ඉන්ස්පෙක්ටර් කෝල්ස් ඉංග්‍රීසි නාට්‍යයේත් රඟපෑවා. තවත් නාට්‍ය රැසකට සම්බන්ධ වුණා.

**ශ්‍රීනාත්**
ඒ කාලයේ වේදිකාවේ ස්වරූපය කුමක්ද?

**සිරිල්**
අපි හැමෝම දන්නවා 70 - 80 කාලය තමයි නාට්‍ය කලාවේ ස්වර්ණමය යුගය බව. ඒකට හේතුව තමයි හෙන්රි ජයසේන, දයානන්ද ගුණවර්ධන, සුගතපාලද සිල්වා, ආර් ආර් සමරකෝන් , රංජිත්ධර්මකීර්ති, ලූෂන් බුලත්සිංහල, බන්දුල විතානගේ, ධර්මසිරි බණ්ඩාරනායක වැනි ප්‍රවීණයන්ගේ නිර්මාණ. මේ අය අතරේ පුංචි සුන්දර තරගයක් තිබුණා. එනිසා බොහෝ හොඳ වේදිකා නාට්‍ය මේ කාලයේ බිහිවුණා. විවිධ ශෛලීන් ඔස්සේ නාට්‍ය බිහිවුණා. ඒ වගේම මේ කාලයේ හුඟක් නාට්‍ය අධ්‍යක්ෂවරුන්ට පිටරට ගොස් අධ්‍යාපනය ලබා එන්නට රාජ්‍ය අනුග්‍රහය ලැබුණා. ඒකෙන් නාට්‍ය කලාව හුඟක් පොහොසත් වුණා. ඔවුන් ඉගෙනගෙන ආ දැනුම නාට්‍ය ශිල්පීන් අතර බෙදා හදා ගත්තා. ඔවුන් අතරේ සැරිසරපු අපට ඔවුන්ගේ දැනුම නොඅඩුව ලබාගන්නට හැකි වුණා. දැන් ඔය මේ කාලේ කරන වර්ක්ෂොප් වගේ කිව්වත් හරි. ඒ කාලේ අපි එක පවුලක් වගේ හිටියෙ. ඒ මිතුරු කම අදත් එහෙමයි. අපි අතර අමනාපකම් නැහැ අපි අපි විවේචනය කරගත් අවස්ථා බොහෙොමයි. ඒ සියල්ල සහෝදර බැම්මෙන්.

**ශ්‍රීනාත්**
ඔබ මෙතෙක් කළ චරිත වලින් ඔබ වඩාත් ප්‍රිය කරන චරිතය මොකක්ද?

**සිරිල්**
ඔය ප්‍රශ්නය හරියට මල්ලි දරුවන් පස් හයදෙනෙක් ඉන්න තාත්ත කෙනෙක්ගෙන් කොයි දරුවටද වැඩිය ආදෙරේ කියලා අහනව වගේ එකක්. මම කැමතියි දූවිලි නාට්‍යයේ සරණපාල ට හුණුවටයේ සොල්දාදුවාට දූවිලි නාට්‍යයේ හාමුදුරුවන්ට. මතකද මේ චරිත සුවශේෂියි. ශ්‍රීනාත් මට හමුවුණේත් දූවිලි නාට්‍යයෙදිනෙ. ශ්‍රීනාත් දූවිලි නාට්‍යයේ රඟපෑ කෙසඟ සාජන්ගේ චරිතය මට තාම මතකයි.

**ශ්‍රීනාත්**
ටෙලිනාට්‍ය ක්ෂෙත්‍රයෙදිත් අපි ඔබේ සුවිශේෂි දස්කම් දැක්කා. ඒ ගැන කියනවා නම්..

**සිරිල්**
80 දශකයේ අපට රූපවාහිණිය ලැබුණා. ඒ කාලයේ අලුත් යමක් රූපවාහිණි ප්‍රේක්ෂකයන්ට තිළිණ කරන්නට එවකට හිටිය බොහෝ නිර්මාණ කරුවන් උත්සාහ ගත්තා. ඒ අතරින් බිහිවුණ සුවිශේෂි අංගයක් තමයි ටෙලිනාට්‍ය. අපේ ටෙලිනාට්‍ය ඒ කාලයේ අනික් රටවල රූපවාහිණී මාධ්‍ය වල තිබුණ සෝප් ඔපෙරා යනුවෙන් හඳුන්වන, ටෙලිනාට්‍ය ලෙසින් හඳුන්වන, වැඩසටහන් වලට වඩා බොහෝ වෙනස් වුණා. එවකට සිටිය අපේ අධ්‍යක්ෂවරු විශාල සමාජ මෙහෙවරක් ටෙලිනාට්‍ය වලින් කරන්නට හැකි බව පෙන්වා දුන්නා. ඒ වගේම ඉතාමත් කලාත්මක අපූරු නිර්මාණ බිහිවුණා. ඒ වගේම ප්‍රේක්ෂකයන් නලු නිළියන්ට දැඩිව ආදරය කළා. මල්ලිට මතක ඇති අපි බෝඩිම කරන කාලේ අපිට හැමෝම දොස් කිව්වා. ඒ දොස් කිව්වෙ තරහට නෙවෙයි. අපි විකට රංගන ශිල්පීන් වෙයි කියලා. මම මනෝ හේමසිරි දයා බන්දුල දීපානි සුනිල් ඒ වගේ බොහෝ අයට මිනිස්සු දොස් කිව්වා. නමුත් අද තත්වය එයිට වඩා හුඟක් වෙනස්. අද මිනිස්සු අපට කියනවා බෝඩිම තරම් හාස්‍යොත්පාදක නාට්‍යයක් මෑත කාලේ බිහිවුණේ නැහැ කියලා. අප මොනම හාස්‍යජනක නාට්‍යයක් බිහිවුණත් බෝඩිමේ කෑලි බෝඩිමේ අංකුර එහි ඇතුළත්.

**ශ්‍රීනාත්**
ඒක හරියටම හරි. බෝඩිම අදටත් ඕනෙ තරම් බලන් පුලුවන්. මම හිතන්නෙ අර සිංහල චිත්‍රපටි කලාවේ අල්ලපුගෙදර චිත්‍රපටය වගේ. ආයෙම අපේ කතාව ටෙලි නාට්‍ය කෙරෙහි යොමු කළොත්..

**සිරිල්**
මම මුළින්ම සම්බන්ධ වුණේ ඩී බී නිහාල්සිංහ මහතාගේ දෙවන ටෙලිනාට්‍යය වන නදී ගීතය ටෙලි නාට්‍යයට. ඉන්පස්සෙ විජය ධර්මශ්‍රීගෙ




සමන්තැන්න.

**ශ්‍රීනාත්**
මේ ටෙලිනාට්‍ය වල පෙම්වතා නේද?

**සිරිල්**
(සිනාසෙමින්) ඔව් ඔව්.. මමයි චන්ද්‍රලේඛයි තමයි.. සමන්තැන්නෙත් පෙම්වතා.. ඒ වගේ ටෙලි නාට්‍ය කීපයක්ම කළා.

**ශ්‍රීනාත්**
එතකොට හර්බට් රංජිත් පීරිස්ගෙ ලෝකාන්තය, හිරුට මුවාවෙන් ටෙලි නාට්‍ය. ඔබේ රංගනයේ විශාල වෙනසක් දැකපු චරිතයක් තමයි ලෝකාන්තය.

**සිරිල්**
හුඟදෙනෙක් මේ ගැන කතා කළා. අපි ලෝකාන්තය කරන කාලේ හරිම නිදහස්. හර්බට් රංජිත් පීරිස් කියන්නෙ අපූරු නිර්මාණ ශිල්පියෙක්. ඒ වගේම හිත හොඳ සුන්දර මනුස්සයෙක්. අපි ලෝකාන්තය රූපගත කරන්න මාස තුනක් විවිධ දර්ශණ තල වල කාලය ගත කළා. ඒ වගේම ඒක කා අතරත් ජනප්‍රිය ටෙලි නාට්‍යක් වුණා. කතාබහටත් ලක්වුණා. ඒ වගේම මට ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතාගේ ගිරය ටෙලි නාට්‍යයට සම්බන්ධ වෙන්නත් අවස්ථාව ලැබුණා. ලෙස්ටර් සුමිත්‍රා යුවලගේ ඇසුරත් මා ලබපු භාග්‍යයක්.

**ශ්‍රීනාත්**
එතකොට ඔබ රුක්මණී දේවියත් සමග කළ රංගනය?

**සිරිල්**
ශ්‍රීනාත් මල්ලි කොහෙන් හොයාගත්තද මන්දා. ඔව්.ඩ මං ඒ අතින් හරිම වාසනාවන්තයි.. රුක්මණී දේවිය කියන්නෙ අපි හැමෝම ආදරය කළ ලංකාවේ බිහිවෙච්ච දක්ෂ සුරූපී නිළියක්. මට වාසනාව ලැබුණා ඇයත් සමග ඔන්න බබෝ ඇතින්නියා වේදිකා නාට්‍යයේ රඟපාන්න. ඒ වගේම ඒ කාලයේ හිටිය බොහෝ දැවැන්තයන් සමග රඟපාන්න මට අවස්ථාව ලැබී තිබෙනවා.

**ශ්‍රීනාත්**
දැන් අපි කලාවෙන් වෙනත් පැත්කට යමු. ඔබ දේශපාලනඥයකු වශයෙන් රත්ගම ප්‍රදේශයේ සභා නායක හැටියටත් දකුණු පළාත් සභාව තුළත් මහජන පක්ෂය නියෝජනය කළා.

**සිරිල්**
විජය කුමාරණතුංගයන් සමග අපි හය දෙනෙක් එකතුවී මහජන පක්ෂය පිහිටුවා ගත්තා. විජය, චන්ද්‍රිකා, වයිපී වැනි අය එතැන හිටියා. අපි දේශපාලනය මැනැවින් කරගෙන ගියා. අපට ඕනෙ වුණේ අලුත් අදහස් ඇති නව දේශපාලන පක්ෂයක් බිහිකරන්නයි. මම හිතන්නෙ අපේ වෑයම සාර්ථක වුණා කියලයි.

**ශ්‍රීනාත්**
ඔබ මහජන පක්ෂයේ සිට එක්සත් ජාතික පක්ෂට යොමුවුණේ කොහොමද?

**සිරිල්**
88 - 89 භීෂණ කාලයේ අපේ සාමාජිකයන් 117 දෙනෙකුට වඩා වැඩි දෙනෙක් මරණයට පත්වුණා. එයට වගකිවයුතු පුද්ගලයන් සමග චන්ද්‍රිකා කුමාරණතුංග මහත්මිය එක්වීම මගේ හිතට ලොකු කළකිරීමක් ගෙනාවා. ඒ කළකිරීමත් එක්කම මම එජාපයට එක්වුණා.

**ශ්‍රීනාත්**
මෙල්බර්න් නුවර වෙසෙන කලාකරුවන් ඔබ දකින්නෙ කොහොමද?

**සිරිල්**
හැමෝම කලාවට කැමතියි. ඒ නිසයි බොහෝ දෙනෙක් ටෙලිනාට්‍ය බලන්නෙ. මට පේන විදිහට ඒ බොහෝ දෙනෙකුට වෙලාවක් නැහැ කලාකටයුතු වලට සම්බන්ධ වෙන්ඩ. හැබැයි ඒ අය නලු නිළියන්ට ටෙලි නාට්‍ය වලට ආදරෙයි. මේ අයට උසස් ගණයේ කලා නිර්මාණ රසවින්දනයට ඉඩ ලබා දිය යුතුයි. දූවිලි සහ කැළණිපාලම නව නිෂ්පාදන දෙකක් මම මෙහිදී කළ බවත් මතක් කරන්න කැමතියි.

**ශ්‍රීනාත්**
ඔබේ අනාගත බලාපොරොත්තු ?

**සිරිල්**
අලුතින් වේදිකා නාට්‍යයක් නිර්මාණය කරන්න මම බලාපොරොත්තුවෙනවා. එයට ලංකාවේ සහ මෙහි සිටිනා නලු නිළියන් සම්බන්ධකරගන්නට මම හිතනවා. ඒ ගැන මූලික වැඩ කටයුතු ගැන තමයි මම මේ දිනවල වෙහෙසෙන්නෙ.

ප්‍රවීණ ලේඛිකා ස්වර්ණකාන්ති රාජපක්ෂ මහත්මිය සිරිල් ධර්මවර්ධන රංගශිල්පියාගේ ආදරණීය බිරිඳයි. බිනර ධර්මවර්ධන ඔහුගේ එකම පුතායි. හෙන්රි ජයසේන ශූරීන් අතින් නම් ලද බිනර ද දක්ශ රංග ශිල්පියෙකි. මේ සොඳුරු කැදැල්ලේ විවේකීව දිවි ගෙවනා සිරිල් ධර්මවර්ධන නම් වන ප්‍රවීණ කලාශිල්පියා පිළිබඳව කතාබහ කරන්නට තව බොහෝ දේ ඇතත් කාලය අපට හරස්වෙයි. ඔහුගේ අනාගත කලාකටයුතු සාර්ථක වන ලෙස සුබ පතමින් අපි සමුගතිමු.